# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු 2026

STATE PRINTING CORPORATION

වාණිජ මුද්‍රණය, ආරක්ෂක මුද්‍රණය, ප්‍රකාශන සහ ලිපි ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිකරණයෙහි නියැලී සිටින මනා ලෙස ස්ථාපිත ලාභ ලබන වාණිජ ආයතනයක් වන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, පහත සඳහන් පුරප්පාඩු සඳහා යහපත් වාර්තා සහිත ක්‍රියාශීලී සහ ප්‍රතිඵල ඉලක්ක කරගත් ශ්‍රී ලාංකිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර (HM 1-3) (තනතුරු 01 යි)

රැකියා විස්තරය: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස, සංස්ථාවේ සමස්ත පරිපාලන හා මූල්‍ය පාලනය සඳහා සාමාන්‍යාධිකාරීවරයාට සහාය වීම, සංස්ථාවේ සියලුම මෙහෙයුම්, කළමනාකරණ සහ උපායමාර්ගික කාර්යයන්හි නියැලීම, ආදයම ඉහළ නැංවීමේ අරමුණින් සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාකාරකම් මෙහෙයවීම, සාමාන්‍යාධිකාරීවරයා නොමැති විට ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ අදාළ නියෝජිතායතන හා අභ්‍යන්තර කමිටු අතර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට වගකිව යුතු සහ බැඳී සිටියි.

**සුදුසුකම්:**

**අධ්‍යාපන: (බාහිර)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව (Physical Science) පිළිබඳ උපාධියක් සහ පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකමක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමග කළමනාකරණ මට්ටමේ අවම වසර දහඅටක (18) පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර පහක් (05) මහා පරිමාණ මුද්‍රණ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද විය යුතුය.

**(අභ්‍යන්තර)**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය මෙම තනතුර සඳහා සුදුසුකම් ලබයි.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්.

**වයස් සීමාව :** වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව බලපානු නොලැබේ.

වැටුප් පරිමාණය: 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි HM 1-3-2025 රු. 152,500/- 15 X 4,100 - 214,000/- (මාසිකව) (2025.03.25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 ට අනුව)

| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (HM 1-3) | |
|---|---|
| 2026.01.01 | 2027.01.01 |
| රු. 133,028 | රු. 152,500 |

**වෙනත් ප්‍රතිලාභ :**

- චක්‍රලේඛ අංක PED 1/2025 (ii) අනුව ප්‍රවාහන දීමනාව.

## 02. සහකාර කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) තනතුර (MM 1-1) (තනතුරු 01)

රැකියා විස්තරය : ආයතනයේ පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණයේ සහායක කාර්යභාරය ඉටු කිරීම සහ ඉහළ අභිප්‍රේරණයකින් යුත්, දැනුමෙන් සහ කුසලතාවයෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් සහතික කිරීම උදෙසා නිසි පරිපාලන හා මානව සම්පත් ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටු කිරීමේදී කළමනාකරුට (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) සහාය වීම.

**සුදුසුකම්**

අධ්‍යාපන: (බාහිර) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සුදුසුකම් ලැබීමෙන් පසුව වසර තුනක (03) පළපුරුද්ද.

**(අභ්‍යන්තර)**

අ) අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය මෙම තනතුර සඳහා සුදුසුකම් ලබයි.

ආ) ඉහත සඳහන් කරුණුවලට අමතරව, JM (කනිෂ්ඨ කළමනාකරු) කාණ්ඩයේ සිටින සහ බාහිර අපේක්ෂකයින්ගේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය ද මෙම තනතුර සඳහා සුදුසුකම් ලබයි.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**වයස් සීමාව :** වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි.

MM 1-1- 2025 රු. 91,690/- 10X2,480 - 15 X 3,450 - 168,240/- (මාසිකව) 2025.03.25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 ට අනුව.

| සහකාර කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන) | |
|---|---|
| 2026.01.01 | 2027.01.01 |
| රු. 81,710 | රු. 91,690 |

## 03. සහකාර කළමනාකරු (වැඩ) තනතුර (MM 1-1) - ඇස්තමේන්තු (තනතුරු 01)

**රැකියා විස්තරය :** සහකාර කළමනාකරු (වැඩ) - ඇස්තමේන්තු ලෙස, දෙපාර්තමේන්තුවේ සියලුම ඇස්තමේන්තු වැඩ අධීක්ෂණය කිරීම සහ ඇස්තමේන්තු අංශයේ සමස්ත කළමනාකරණ කාර්යයන් සිදු කිරීම.

**සුදුසුකම් :**

**අධ්‍යාපන (බාහිර) :** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා උපාධියක් සහ මහා පරිමාණ මුද්‍රණ ආයතනයක පශ්චාත් සුදුසුකම් ලැබීමෙන් පසු වසර තුනක (03) පළපුරුද්ද.

**(අභ්‍යන්තර) :** අ) අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (Junior Manager) කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය මෙම තනතුර සඳහා සුදුසුකම් ලබයි.

ආ) ඉහත කරුණු වලට අමතරව, දැනටමත් JM කාණ්ඩයේ සිටින සහ බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් සපුරා ඇති අය ද මෙම තනතුර සඳහා සුදුසුකම් ලබයි.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්.

**වයස් සීමාව :** වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** 01.01.2027 දින සිට ක්‍රියාත්මක වන පරිදි. MM 1-1-2025 රු. 91,690/- 10X2, 480 - 15 X 3,450 - 168,240/- (මාසික) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 25.03.2025 දිනැති අංක 01/2025 දරන චක්‍රලේඛය අනුව.

| සහකාර කළමනාකරු (වැඩ) - ඇස්තමේන්තු MM 1-1 | |
|---|---|
| 01.01.2026 | 01.01.2027 |
| රු. 81,710 | රු. 91,690 |

**සේවා කොන්දේසි :** ඉහත තනතුර ස්ථිර වන අතර වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. අභ්‍යන්තරව තෝරා ගනු ලබන, පෙර තනතුරේ දැනටමත් ස්ථිර කර ඇති සේවකයින් වසරක (01) වැඩ බලන කාලයකට යටත් වනු ඇත.

**වෙනත් දීමනා :** වැටුපට අමතරව පහත දීමනා ද අදාළ වේ.

- චක්‍රලේඛ අනුව රජය අනුමත දීමනා
- පැමිණීමේ දිරි දීමනා
- ආහාර දීමනා

**වෙනත් අමතර ප්‍රතිලාභ :**

- සේවකයා සහ පවුලේ අය ආවරණය වන වෛද්‍ය යෝජනා ක්‍රමය.
- කාර්ය සාධන දර්ශක (KPI) මත පදනම් වූ දිරි දීමනා ක්‍රමය.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF).
- භාවිත නොකළ නිවාඩු සඳහා මුදල් ලබා ගැනීම

**අයදුම් කළ යුතු ආකාරය :**

- 02.02.2026 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සහ සුදුසුකම් තහවුරු කළ හැකි උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත කරුණු වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රජයේ/ රාජ්‍ය ආයතන/ සංස්ථා/ මණ්ඩල සේවයේ නියුතු අය තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.
- අයදුම්පත අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, පානලුව, පාදුක්ක**" යන ලිපිනයට යොමු කළ යුතු අතර 2026.02.02 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අතින් ගෙනවිත් භාර දිය හැක. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මෙහි සඳහන් නොවන යම් කරුණක් වේ නම්, බඳවා ගැනීම් පිළිබඳ බලධාරියා විසින් ඒ පිළිබඳ තීරණය කරනු ඇත. කුමන ආකාරයක හෝ බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සභාපති,**
**රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානලුව, පාදුක්ක.**

SPC